// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1999/22 – 2016 දෙසැම්බර් 26 වැනි සඳුදා – 2016.12.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරන ලද ඉඩම්, පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගම්පහසිය පත්තුව සුළු කොට්ඨාසයේ, මඩවල (අ.ග.පි. 23) ගමේ පිහිටි, මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක MA/MLT/2011/346 හා 2013.04.30 දිනැති ප්‍රගමණ අනුරේඛණයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක් 7.5036ක් වන කැබලි අක්ෂර 'ඒ' සහ 'බී' වශයෙන් දක්වා ඇති ඉඩම් කොටස්වලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – ජර්මන්වත්ත – ප්‍රමාණය: **හෙක්. 7.4441 ක් පමණ**

උතුරට: මෙම ඉඩමේ ඉතිරි කොටස (මාර්ගය); නැගෙනහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට: මාර්ගය සහ පී. එම්. ගුණසේකර හිමිකම් කියන ජර්මන්වත්ත; බටහිරට: පී. එම්. ගුණසේකර හිමිකම් කියන ජර්මන්වත්ත.

02. කැබලි අක්ෂර 'බී' – ජර්මන්වත්ත – ප්‍රමාණය: **හෙක්. 0.0595 ක් පමණ**

උතුරට: මාර්ගය; නැගෙනහිරට සහ දකුණට: පී. එම්. ගුණසේකර හිමිකම් කියන ජර්මන්වත්ත; බටහිරට: මාර්ගය.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4/3/15/2011/විජ්/131.
2016 ඔක්තෝබර් මස 27 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

01-254

1A – G24786 – 10 (2016/12)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*